# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1875/29 - 2014 අගෝස්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2014.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2014 අගෝස්තු මස 05 වැනි දින දී ය.

### නියමාවලිය

1. මෙම නියමාවලිය 2014 අංක 3 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2014.08.05 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 2005 ඔක්තෝබර් මස 31 වන දින අංක 1417/12 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 4 වන ඡේදයේ-

(i) (ඇ) අනුඡේදයේ "ඉංග්‍රිසි" යන වචනය වෙනුවට "ඉංග්‍රීසි" යන වචනය ආදේශ කිරීමෙන් ;

(ii) (ඉ) අනුඡේදයේ "විශිෂ්ඨතා" යන වචනය වෙනුවට "විශිෂ්ටතා" යන වචනය ආදේශ කිරීමෙන් ;

(iii) (ඊ) අනුඡේදයේ "ආයතන" යන වචනය වෙනුවට "ආයතන" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(iv) (ග) අනුඡේදයේ "කර්තව්‍යවලට" යන වචනය වෙනුවට "කර්තව්‍යවලට" යන වචනය ආදේශ කිරීමෙන් ;

1A - G 2138— 355 (2014/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(2) එහි 6 වන ඡේදයේ "අධ්‍යක්ෂවරයකුම" යන වචනය වෙනුවට "අධ්‍යක්ෂවරයකුම" යන වචනය ආදේශ කිරීමෙන් ;

(3) එහි 7 වන ඡේදයේ "අධ්‍යක්ෂවරයා" යන වචනයේ සිට "නිළධරයා වන්නේය." යන වචන දක්වා ඇති සියලුම වචන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :-

"අධ්‍යක්ෂවරයා, ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා සහ නිල බලයෙන් ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු ද වන්නේ ය.".

(4) එහි 8 වන ඡේදයේ (i) වන අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(i) (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය ;".

(5) එහි 9 වන ඡේදයේ-

(i) (1) වන අනුඡේදයේ "නිල බලයෙන් පත්වන සාමාජිකයන් හය දෙනෙක්, එනම්" යන වචන වෙනුවට "පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන් " යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (1)(ඇ) අනුඡේදයේ "කොමිෂන් සභාවේ" යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) (1) (ඉ) අනුඡේදයේ "විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි මහාචාර්යවරුන් " යන වචන වෙනුවට "විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි මහාචාර්යවරුන් " යන වචන ආදේශ කිරීමෙන් ;

(iv) (2) වන අනුඡේදයේ "තවත් සාමාජිකයන් අටදෙනෙක් " යන වචන වෙනුවට "තවත් සාමාජිකයන් දොළොස් දෙනෙක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(v) (2) (ආ) අනුඡේදයේ "ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්යවරුන් පස් දෙනෙක් " යන වචන වෙනුවට "ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්යවරුන් පස් දෙනෙක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(vi) (2) (ඇ) අනුඡේදයේ "අධ්‍යයන මණ්ඩල" යන වචන වෙනුවට "අධ්‍යයන මණ්ඩල" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(vii) (2) (ඊ) අනුඡේදයේ "ආයතනයේ " යන වචනය වෙනුවට "ආයතනයේ " යන වචන ආදේශ කිරීමෙන් ;

(6) එහි 10 වන ඡේදයේ

(i) (1) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(1) මණ්ඩලයේ සභාපතිවරයා අධ්‍යක්ෂවරයා විය යුතු අතර ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, සාමාජිකයන් විසින් එම සාමාජිකයන් අතරින් වෙනත් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(ii) (අ) (2) වන අනුඡේදයේ "නම් කළ" යන වචන වෙනුවට "නම් කළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (2) වන අනුඡේදයේ අතුරු විධානයේ "අනුප්‍රාප්තිකයා" සහ "නොගෙවී ඉතිරිව ඇති " යන වචන වෙනුවට "අනුප්‍රාප්තිකයා" සහ "නොගෙවී ඉතිරිව ඇති" යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) (6) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(6) මණ්ඩලයේ යම් සාමාජිකයකු, අවසර නොලබා මණ්ඩලයේ යම් අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත්, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධුරය අත්හැරියා සේ සැළකිය යුතු අතර, (3) (4) හා (5) වන අනුඡේදවල සඳහන් පත්කිරීමේ බලධරයා විසින්, 9 වන නියෝගයේ (2) වන ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඉන් ඇති වන පුරප්පාඩුව සඳහා යෝග්‍ය තැනැත්තකු පත් කළ යුතු ය." ;

(iv) (7) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(7) ආයතනයේ සේවා නියුක්තකයකු වන මණ්ඩලයේ සාමාජිකයකුට කිසි පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකමක් නොමැති නමුත් අනෙකුත් සාමාජිකයන්ට ආයතනය විසින් විශ්වවිද්‍යාලය විමසා කොමිෂන් සභාවේ අනුමතය ඇතිව පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවිය යුතු ය." ;

(v) (8) වන අනුඡේදයේ "තුනෙන් එකක් " යන වචන වෙනුවට "තුනෙන් එකක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(vi) (9) වන අනුඡේදයේ "එසේ වුවද " යන වචන වෙනුවට "එසේවුවද " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(vii) (10) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(10) මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය." ;

(7) එහි 11 වන ඡේදයේ-

(i) (ඈ) අනුඡේදයේ "එකඟත්වය" යන වචනය වෙනුවට "එකඟත්වය " යන වචනය ආදේශ කිරීමෙන් ;

(ii) (අ) (ඒ) අනුඡේදයේ "විශ්වවිද්‍යාලය විමසා" යන වචන ඉවත් කිරීමෙන්

(ආ) (ඒ) (iii) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

" (iii) ආයතනයේ ආචාර්යවරුන් සහ පරීක්ෂකවරුන් ලෙස පත්කර ගැනීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් ;

පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම." ;

(iv) (ඔ) අනුඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඔ) ශිෂ්‍යයන්ගේ සහ ආයතනයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ ශිෂ්‍යභාවය හෝ සේවය අත්හිටුවීම, පහ කිරීම හෝ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාවේ යෙදීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම; " ;

(iv) (ජ) අනුඡේදයේ "නියමාවලිය" යන වචනය වෙනුවට "නියමාවලිය" යන වචන ආදේශ කිරීමෙන් ;

(8) එහි 12 වන ඡේදයේ -

(i) (1) වන අනුඡේදයේ "අධ්‍යයන මණ්ඩලයක් හෝ අධ්‍යයන මණ්ඩල" යන වචන වෙනුවට "අධ්‍යයන මණ්ඩලයක් හෝ අධ්‍යයන මණ්ඩල" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (1) (ඉ) අනුඡේදයේ "මණ්ඩලය විසින් " යන වචන වෙනුවට "අදාළ අධ්‍යයන මණ්ඩලය විසින් " යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) (2) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(2) අධ්‍යයන මණ්ඩලය හෝ මණ්ඩල විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නිශ්චිත කාර්යයක් සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා තැනැත්තන් එක්කෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් වැඩිපුර එක් කර ගත හැකි නමුත් එසේ වැඩිපුර එක් කර ගන්නා ලද කිසිදු තැනැත්තකුට අධ්‍යයන මණ්ඩලයේ හෝ මණ්ඩලවල ඡන්ද විමසීමක දී ඉදිරිපත් වීමට හෝ යම් රැස්වීමකදී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැත්තේ ය." ;

(iv) (3) වන අනුඡේදය ඉවත් කිරීමෙන් ;

(v) (5) වන අනුඡේදයේ "සාමාජිකයන්- " යන වචනය වෙනුවට "සාමාජිකයන්- " යන වචනය ආදේශ කිරීමෙන් ;

(vi) (5) (අ) අනුඡේදයේ "අධ්‍යයන මණ්ඩලයක හෝ අධ්‍යයන මණ්ඩලවල" යන වචන වෙනුවට "අධ්‍යයන මණ්ඩලයක හෝ අධ්‍යයන මණ්ඩලවල" යන වචන ආදේශ කිරීමෙන් ;

(vii) (6) වන අනුඡේදයේ (ඉ) යන අක්ෂරය වෙනුවට "(ඈ)" අක්ෂරය ආදේශ කිරීමෙන් ;

(viii) (7) වන අනුඡේදයේ "මණ්ඩලවල" යන වචනය වෙනුවට "මණ්ඩලවල" යන වචනය ආදේශ කිරීමෙන් ;

(ix) (8) වන අනුඡේදයේ "සම්පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් එකක" යන වචන වෙනුවට "සම්පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් එකක" යන වචන ආදේශ කිරීමෙන් ;

(9) එහි 13 වන ඡේදයේ -

(i) (2) වන අනුඡේදයේ "(1) වන අනුඡේදයන් ශාස්ත්‍රීය කමිටුවට පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ශාස්ත්‍රීය කමිටුව විසින් -" යන වචන වෙනුවට "(1) අනුඡේදයෙන් අධ්‍යයන මණ්ඩලයට හෝ මණ්ඩලවලට පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අධ්‍යයන මණ්ඩලය හෝ මණ්ඩල විසින් - " යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (2) (ඇ) අනුඡේදයේ "ශාස්ත්‍රීය කමිටුවේ" යන වචන වෙනුවට "ශාස්ත්‍රීය කමිටුවේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) (2) (ඉ) අනුඡේදයේ "ඒ විධිවිධානවල ප්‍රතිඵලයක් " යන වචන වෙනුවට "ඒ විධිවිධානවල ප්‍රතිඵලයක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(10) එහි 15 වන ඡේදයේ

(i) (1) වන අනුඡේදයේ "සඳහන් කරනු ලබන" යන වචන වෙනුවට "සඳහන් කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (2) වන අනුඡේදයේ "වර්ග කර" යන වචන වෙනුවට "වර්ග කර" යන වචන ආදේශ කිරීමෙන් ;

(11) එහි 16 වන ඡේදයේ-

(i) (අ) අනුඡේදයේ "ගිණුම් ශිර්ෂවලට" යන වචන වෙනුවට "ගිණුම් ශීර්ෂවලට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) අතුරු විධානයේ සඳහන් "ආයතනයේ ගිණුම්වල" යන වචන වෙනුවට "ආයතනයේ ගිණුම්වල" යන වචන ආදේශ කිරීමෙන් ;

(12) එහි 19 වන ඡේදයේ (2) වන අනුඡේදයේ "ආයතනයේ කාර්ය මණ්ඩලයට" යන වචන වෙනුවට "ආයතනයේ කාර්ය මණ්ඩලයට" යන වචන ආදේශ කිරීමෙන් ;

(13) එහි 21 වන ඡේදයේ "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :-

"කොමිෂන් සභාව" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

08-979

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.